# කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගනණය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම්වල ඇතුළත් ගොඩනැගිලි ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා වැය කළ රු.1,144,218 ක් වූ වටිනාකම පමණක් ඇතුළත්ව තිබුණු අතර, ආයතනය සතු වර්ග අඩි 3843(ආසන්න වශයෙන්) ක් වූ ගොඩනැගිලි 04 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01(SLPSAS 01) හි 21(ඉ) උප ඡේදය ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ විචලනයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ප්‍රාග්ධන ප්‍රදාන වලින් සමාලෝචිත වර්ෂය තුළ දී රු.2,040,365 ක් සහ ඉකුත් වර්ෂවලදී රු.4,488,268 ක ස්ථාවර වත්කම් මිල දී ගෙන තිබුණ ද ඊට අදාල ක්‍රමක්ෂය මූල්‍ය ප්‍රකාශන වල ගැලපුම් කර නොතිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ආයතනය පවත්වාගෙන යන අක්කර 300 කට ආසන්න භූමි භාගයේ නීත්‍යානුකූල අයිතිය පවරා ගත් බවට ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

## 1.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 394 | කොළඹ විශ්වවිද්‍යාලය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් 2011 වර්ෂයේ නිකුත් කර අවලංගු කර තිබුණු එකතුව රු.212,540 ක් වටිනා චෙක්පත් 2013 ඔක්තෝබර් 10 දින වන විටත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 25 | ප්‍රාග්ධන වත්කම් සම්පාදනය සඳහා රජය විසින් ලබා දී තිබූ ප්‍රදානවලින් රු.20,335,420 ක් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ස්ථිර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.5,726,107 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,387,001 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.7,921,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.2,194,893 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.7,216,606 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු.1,829,605ක අතිරික්තයක බවට පත්වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.365,288 ක වාසිදායක තත්ත්වයට රජයේ ප්‍රදාන රු.704,394 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ආයතනය විසින් භාවිතයට නොගෙන දිගු කාලයක සිට ගබඩා කර තිබූ රු.30,275 ක් වටිනා ද්‍රව්‍ය හා වටිනාකම නශ්චය කර නොතිබූ අබලි තත්ත්වයේ ද්‍රව්‍ය අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ආයතනයෙ පර්යේෂණ කටයුතු සඳහා ලැබුණු එකතු වටිනාකම රු.2,922,753 ක් වූ ප්‍රදානයන් වෙනත් විවිධ කටයුතු සඳහා වැයකර තිබූ නමුත්, අරමුදල් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලදී ආයතන සංවර්ධන අරමුදලකට මාරුකර තිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

4.1 **සංයුක්ත සැලැස්ම**

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ඵලදායීව යොදාගැනීමට හා මගපෙන්වීමට හැකිවනු පිණිස සංයුක්ත සැලැස්මක් සකස් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ආයතනය වෙත ලැබී තිබූ අරමුදල් ඌණ උපයෝජිතව පැවතුණි.

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර මේ හේතුවෙන් 2012 වර්ෂයේදී ළගාකර ගැනීමට / ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක සහ , එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අනුමත කළ අයවැය ලේඛණයට සිදුකරනු ලැබූ සංශෝධන ඇතුළත් අයවැය ලේඛණය කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත කර පිටපතක් විගණනයටද ඉදිරිපත් කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) මාර්ගෝපදේශයේ සඳහන් පරිදි අවම වශයෙන් වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් වන පරිදි, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.9,656,415 ක් වටිනා මිලදීගැනීම් හා ප්‍රග්ධන වැය දරා තිබුණි.

## 4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 නොවැම්බර් 15 දින වන විටත් සභාගත කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ව්‍යාපෘති අරමුදල් කළමනාකරණය